ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2017 ජුනි මස 23 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය : අංක 04 - 2017

පවතින සහ වෙනස් වන දේශීය හා ජාත්‍යන්තර සාර්ව ආර්ථික වාතාවරණය සලකා බලා දැනට පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය යෝග්‍ය බව 2017 ජුනි මස 22 වැනි දින පැවති රැස්වීමේ දී මුදල් මණ්ඩලයෙහි අදහස වූ අතර ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේ නොවෙනස්ව පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය තීරණය කළේය.

මුදල් මණ්ඩලයෙහි මෙම තීරණය, මැදි කාලීනව උද්ධමනය මැදි-තනි අගයක මට්ටමේ පවත්වා ගැනීමත්, එමගින් තිරසාර වර්ධන මාවතකට පහසුකම් සැලසීමත් යන අරමුණ හා අනුකූල වේ. මෙම මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සඳහා වූ පසුබිම පහත පරිදි වේ.

ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තු අනුව, 2017 වසරේ පළමු කාර්තුව තුළ දී ශ්‍රී ලංකා ආර්ථිකය වාර්ෂික ලක්ෂ්‍යාමය පදනම මත සියයට 3.8 කින් වර්ධනය විය. අහිතකර කාලගුණික තත්ත්වය මත විශේෂයෙන්ම, කෘෂිකර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් කෙරෙහි වූ අහිතකර බලපෑම් හේතුවෙන් පළමු කාර්තුව තුළ දී ආර්ථික වර්ධනය මන්දගාමී විය. ඉදිකිරීම් අංශයේ අඛණ්ඩ වර්ධනය

හේතුවෙන් කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම් ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ අතර, සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් මන්දගාමී වර්ධනයක් වාර්තා කළේය. වසරේ දෙවන භාගය තුළ දී ආර්ථිකය යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2017 වසරේ පළමු කාර්තුව තුළ දී ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලද කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද. 2013 = 100) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද. 2013 = 100) වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මනිනු ලබන මතුපිට උද්ධමනය අප්‍රේල් සහ මැයි මාස තුළ දී අපේක්ෂා කරන ලද පරිදි මන්දගාමී විය. මූලික උද්ධමනය ද ඊට සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. බදු සංශෝධනවල පදනම් බලපෑම සහ කාලගුණික තත්ත්ව හේතුවෙන් සැපයුම් අංශයෙහි ඇති වූ අවහිරතාවල බලපෑම ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී පහව යනු ඇතැයි අපේක්ෂා කෙරෙන හෙයින් 2017 වසර අවසානය වන විට උද්ධමනය මැදි-තනි අගයක මට්ටම දක්වා ක්‍රමානුකූලව අඩු වී ඉන් පසුව ස්ථාවර වනු ඇතැයි පුරෝකථනය කෙරේ.

ප්‍රධාන වශයෙන්, බැංකු අංශය වෙතින් පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයම වෙත සපයන ලද දේශීය ණය ඉහළ යෑම හේතුකොටගෙන 2017 වසරේ අප්‍රේල් මාසය අවසානය වන විට මුදල් ප්‍රසාරණය ඉහළ මට්ටමක පැවතිණ. පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණයෙහි වර්ධනය අඛණ්ඩව ක්‍රමානුකූලව මන්දගාමී විය. වෙළඳපොළෙහි ඉහළ නාමික සහ මූර්ත ණය පොලී අනුපාතික පවතින හෙයින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය වර්ධනය තවදුරටත් මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රධාන රජය සතු ව්‍යවසායන්හි මූල්‍ය කාර්යසාධනයට අදාළ ගැටලු විසඳීමෙහි අවශ්‍යතාව පිළිබිඹු කරමින්, රජය සතු ව්‍යවසාය මගින් ලබා ගන්නා ලද ණය ප්‍රමාණයෙහි මෑතකාලීන ඉහළ යෑම හේතුවෙන් සමස්ත දේශීය ණය හැසිරීම කෙරෙහි අවධානමක් ඇති කොට තිබේ. මේ අතර, 2017 අප්‍රේල් මාසය තුළ දී රජය විසින් ලබා ගන්නා ලද ශුද්ධ ණය ප්‍රමාණයෙහි අඩු වීමක් දක්නට ලැබුණි. අඛණ්ඩව ක්‍රියාත්මක වන ආදායම් පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය සහ විදේශ ණය ගැනීම් තුළින් රජය වෙත ලැබුණු අරමුදල් රජයේ සුරැකුම්පත් වෙළඳපොළ තුළ පොලී අනුපාතික මත ඇති පීඩනය සැලකිය යුතු ලෙස අවම කිරීමට හේතු වී ඇත.

2017 මාර්තු සහ අප්‍රේල් මාසවල දී අපනයන ක්‍රියාකාරකම් වැඩිදියුණුවීම හමුවේ වුව ද, ආනයන වියදම් ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳ හිඟය පුළුල් වී ඇත. වසරේ

පළමු මාස පහ තුළ සංචාරක කර්මාන්තය ආශ්‍රිත විදේශීය ලැබීම් ඉහළ ගිය අතර, 2017 මැයි මාසයේ දී වාර්තා වූ සංචාරක පැමිණීම් අඩු වීම තාවකාලික තත්ත්වයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2017 වසරේ පළමු මාස හතර තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඩු වීමක් වාර්තා වූ අතර, මැදපෙරදිග කලාපයේ පවතින භූ-දේශපාලනික අර්බුද තවදුරටත් ඉහළ යෑම හේතුවෙන් ඉදිරි කාලයේ දී එවැනි විදේශ විනිමය ලැබීම් මත අහිතකර බලපෑම් එල්ල විය හැකිය. 2017 මාර්තු මාසයේ සිට රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපළ වෙත ශුද්ධ විදේශ ලැබීම් දක්නට ලැබුණු අතර, කොළඹ කොටස් වෙළඳපොළ සඳහා වූ ලැබීම් ද ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. විදේශ සංචිත ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2017 මාර්තු මාසයේ සිට දේශීය වෙළඳපොළ තුළින් විදේශ විනිමය අඛණ්ඩව අවශෝෂණය කර ගන්නා ලදී. මෙම ප්‍රවණතා සහ සාර්ථකව සිදු කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව මෙන්ම රජය වෙත ලද ඒකාබද්ධ ණය ලැබීම් හේතුවෙන් 2017 ජූනි මස මැද වන විට දළ නිල සංචිත එ.ජ.ඩොලර් බිලියන 7.0 ඉක්මවා වර්ධනය විය. මේ අතර, 2017 වසරේ ජූනි මස 21 වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 2.3 කින් අවප්‍රමාණය වී ඇත.

මෙම පසුබිම තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 7.25 සහ සියයට 8.75 යන දැනට පවතින මට්ටමේ පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය තීරණය කළේය.

| **මුදල් ප්‍රතිපත්ති තීරණය:** | **ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවතී** |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR)<br>නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR)<br><br>ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 7.25<br>සියයට 8.75<br><br>සියයට 7.50 |

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2017 අගෝස්තු මස 03 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

**සංඛ්‍යා ඇමුණුම:**

## සංඛ්‍යා සටහන 1: මූර්ත ද.දේ.නි.යේ වර්ධනය (තාවකාලික)

| ආර්ථික කටයුතු | 2016 | 2017 |
|---|---|---|
| | **වාර්ෂික** | **පළමු කාර්තුව** |
| කෘෂිකාර්මික | -4.2 | -3.2 |
| කර්මාන්ත | 6.7 | 6.3 |
| සේවා | 4.2 | 3.5 |
| **ද.දේ.නි.** | **4.4** | **3.8** |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## සංඛ්‍යා සටහන 2 : උද්ධමනය

| මාසය | | දෙසැ-16 | ජන-17 | පෙබ-17 | මාර්-17 | අප්‍රේ-17 | මැයි-17 |
|---|---|---|---|---|---|---|---|
| **මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස %)** | කො.පා.මි.ද. (2013=100) | 4.5 | 5.5 | 6.8 | 7.3 | 6.9 | 6.0 |
| | ජා.පා.මි.ද. (2013=100) | 4.2 | 6.5 | 8.2 | 8.6 | 8.4 | 7.1 |
| **මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස %)** | කො.පා.මි.ද. (2013=100) | 5.8 | 7.0 | 7.1 | 7.3 | 6.8 | 5.2 |
| | ජා.පා.මි.ද. (2013=100) | 6.7 | 7.1 | 7.1 | 7.0 | 5.9 | 4.7 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## සංඛ්‍යා සටහන 3 : මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රු. බිලි.) | | | | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දෙසැ-16 | ජන-17 | පෙබ-17 | මාර්-17 | අප්‍රේ-17 | දෙසැ-16 | ජන-17 | පෙබ-17 | මාර්-17 | අප්‍රේ-17 |
| සංචිත මුදල් | 856 | 828 | 848 | 892 | 886 | *27.1* | *15.3* | *14.6* | *12.7* | *16.0* |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 5,406 | 5,460 | 5,552 | 5,677 | 5,731 | *18.4* | *17.7* | *18.0* | *20.0* | *20.1* |
| ශුද්ධ විදේශීය වත්කම් | (231) | (328) | (370) | (371) | (341) | *22.4* | *9.1* | *7.9* | *15.6* | *26.6* |
| ශුද්ධ දේශීය වත්කම් | 5,637 | 5,788 | 5,922 | 6,049 | 6,072 | *15.9* | *15.8* | *16.0* | *17.0* | *16.0* |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 1,972 | 2,113 | 2,192 | 2,215 | 2,206 | *12.1* | *13.1* | *14.1* | *13.3* | *12.6* |
| රාජ්‍ය ව්‍යවසායන් සඳහා ලබා දුන් ණය | 495 | 518 | 535 | 553 | 557 | *-5.3* | *-1.8* | *1.6* | *7.5* | *9.0* |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 4,204 | 4,222 | 4,293 | 4,375 | 4,394 | *21.9* | *20.9* | *21.0* | *20.4* | *20.0* |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 6,630 | 6,711 | 6,811 | 6,951 | 7,033 | *15.9* | *16.1* | *16.4* | *18.2* | *18.4* |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 4 : පොලී අනුපාතික

| **පොලී අනුපාතික (%)** | **2016 දෙසැම්බර් අවසානයට** | **2017 ජනවාරි අවසානයට** | **2017 පෙබරවාරි අවසානයට** | **2017 මාර්තු අවසානයට** | **2017 අප්‍රේල් අවසානයට** | **2017 මැයි අවසානයට** | **2017 ජුනි 22 දිනට** |
|---|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති අනුපාතික** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 7.00 | 7.00 | 7.00 | 7.25 | 7.25 | 7.25 | 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.50 | 8.50 | 8.50 | 8.75 | 8.75 | 8.75 | 8.75 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 8.42 | 8.38 | 8.49 | 8.75 | 8.72 | 8.72 | 8.75 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | | |
| දින 91 | 8.72 | 9.03 | 9.32 | 9.63 | 9.73 | 9.61 | 9.60 |
| දින 182 | 9.63 | 10.07 | 10.19 | 10.62 | 10.70 | 10.35 | 10.29 |
| දින 364 | 10.17 | 10.37 | 10.58 | 10.98 | 11.02 | 10.71 | 10.47 |
| **ණය අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 11.52 | 11.49 | 11.70 | 11.79 | 11.78 | 11.40 | 11.88 |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 13.20 | 13.28 | 13.29 | 13.40 | 13.52 | - | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 14.37 | 14.49 | 14.62 | 14.54 | 15.00 | - | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 8.17 | 8.42 | 8.66 | 8.81 | 8.89 | 8.99 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 10.46 | 10.84 | 11.15 | 11.38 | 11.43 | 11.52 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 11.17 | 11.38 | 11.20 | 11.49 | 11.38 | - | - |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව